# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා

2024.08.

දෙවන වාර පරීක්ෂණය - 2024 | 7 ශ්‍රේණිය | කාලය පැය 02

Learning Resource Center
R
De Mazenod College
Kandana

- ➢ අංක 1 සිට 10 දක්වා වූ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ➢ අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න වල දී ඇති පිළිතුරු වලින් වඩා සුදුසු පිළිතුර තෝරන්න.

01)

1. පස සොදාපාළුව වැළැක්වීම සඳහා යොදාගත හැකි අජීව බාධකයකි.
   - i. සේර වැනි ශාක වැටි සිටුවීම
   - ii. ගල්වැටි බැඳීම
   - iii. වට්ටක්කා වැනි බෝග වගා කිරීම
   - iv. ග්ලිරිසීඩියා වැටක් සිටුවීම

2. නැවත භාවිතය තුළින් අපද්‍රව්‍ය රැස්වීම අවම කරගත හැකි ක්‍රමයකි.
   - i. නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම
   - ii. ආහාර එතීම සඳහා පොලිතින් වෙනුවට කෙසෙල් කොළ යොදා ගැනීම
   - iii. වෙළඳ පොළට යාමේදී රෙදි බෑගයක් රැගෙන යාමෙන් පොලිතින් උර රැස්වීම අවම වීම
   - iv. පැළ හා බීජ සිටුවීමට කිරිපිටි උර, පොලිතින් උර යොදා ගැනීම

3. වගා කිරීමේදී තවාන් දමා පැළ ලබාගෙන ක්ෂේත්‍ර යේ සිටුවන ශාක වර්ගයකි.
   - i. තක්කාලි
   - ii. කෙසෙල්
   - iii. බතල
   - iv. කහ

4. ආවරණ ශාක ලෙස යොදා ගන්නා ශාක වර්ගයකි.
   - i. බ්‍රසිනා
   - ii. එපිසියා
   - iii. වෙන්ඩරින් ජු
   - iv. උඳුපියලි

5. ආහාර අමුද්‍රව්‍ය වල භෞතික ස්වභාවය වෙනස්කර විවිධත්වයෙන් යුතු ආහාර සැලසීමේ වාසියක් නොවන්නේ,
   - i. ආහාරයට ගැනීමට ප්‍රිය උපදවන සේ සකස් වීම
   - ii. ජීරණයට පහසු වනසේ සකස්වීම
   - iii. රසය මෙන්ම පොෂණය ආරක්ෂා වීමට වගබලා ගැනීම
   - iv. පෝෂණ ගුණය අවම වෙමින් රසයට පමණක් මුල් තැන දීම

6. ආහාර අමුද්‍රව්‍ය යුෂ බවට පත්කර ගැනීම වැදගත් වන අවස්ථාවක් නොවන්නේ,
   - i. පාන වර්ග සඳහා පලතුරු යුෂ ලබා ගැනීමේදී
   - ii. ආප්ප, තොසේ වැනි ආහාර සැකසීමේදී
   - iii. පොල් කිරි ලබා ගැනීමේදී
   - iv. පොළ කැද සෑදීම සඳහා ඖෂධීය කොළවල යුෂ ලබා ගැනීමේදී

7. පරිපථයක් තුළින් ගලායන විදුලි ධාරාව පාලනය කිරීමට යොදා ගන්නා උපාංගයකි.
   - i. වියළි කෝෂය
   - ii. ප්‍රතිරෝධක
   - iii. විදුලි මෝටර
   - iv. ධාරිත්‍රක

8. හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසියකි.
   - i. ව්‍යාපාරයේ අලාභදායක තත්වයක් වුවහොත් අයිතිකරු තනිව ඊට මුහුණ දිය යුතුය
   - ii. විවිධ දක්ෂතා ඇති පුද්ගලයින් හවුල් කරුවන් ලෙස ව්‍යාපාරයට සම්බන්ධ කරගත හැකිය
   - iii. තීරණ ගැනීමේදී අයිතිකරුට තම තනි කැමැත්ත අනුව තීරණ ගත හැක
   - iv. ව්‍යාපාරයෙන් ලැබෙන මුළු ලාභය එක් අයිතිකරුවෙක්ට හිමිවේ.

9. භූමි අලංකරණය සඳහා යොදා ගන්නා විවිධ උපාංග ප්‍රධාන වශයෙන් ආකාර,
   - i. 3කි
   - ii. 5කි
   - iii. 2කි
   - iv. 4කි

10. විද්‍යුත් පරිපථයක ධාරාව ගලායන නිවැරදි දිශාව වන්නේ,

i. ධන අග්‍රයේ සිට ඍණ අග්‍රය වෙතටය

ii. ධන අග්‍රයේ සිට ධන අග්‍රය වෙතටය

iii. ඍණ අග්‍රයේ සිට ධන අග්‍රය වෙතටය

iv. ඉහත සියල්ල අසත්‍ය වේ

II කොටස

ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

1)

1. භූමි අලංකරණයේදී සෙවන ලබා ගැනීම සඳහා සිටුවිය හැකි විශාල ශාක 2ක් නම් කරන්න. ල.2
2. භූමි අලංකරණයේදී බෝඩර් ලෙස ශාක සිටුවන අවස්ථා 3ක් ලියන්න. ල.3
3. භූමි අලංකරණයේදී ශාකවලින් අපේක්ෂා කරන කාර්යයන් 5ක් ලියන්න. ල.5

2)

1. භූමි අලංකරණයට යොදාගන්නා මෘදු උපාංග දෘඪ උපාංග දෙක බැගින් ලියන්න. ල.4
2. පාසල් භූමියක් අලංකරණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් ලියන්න. ල.3
3. අලංකරණය කරන ලද භූමියක් නඩත්තු කිරීමට ඉටු කළ යුතු කාර්යයන් 3ක් ලියන්න. ල.3

03)

1. ප්‍රධාන ජල සැපයුමේ සිට සැපයෙන ජලය හෝ ළිඳකින් පොම්පකරන ජලය නිවෙස ආශ්‍රිතව සකසා ඇති ජල ටැංකියක ගබඩා කර තැබීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න. ල.2
2. පහත දක්වා ඇති ජල නළ උපාංග වල රූප සටහන් ඇද ඒවායින් කෙරෙන කාර්ය ලියන්න ල.8
   a) සමාන කෙවෙනිය
   b) ඌනිත කෙවෙනිය
   c) T සන්ධිය
   d) වැලමිට නැම්ම ම

04)

1. වෙළඳපොලින් භාණ්ඩයක් මිලදී ගැනීමේදී පාරිභෝගිකයා විසින් සැලකිලිමත් විය යුතු කරුණු 4ක් ලියන්න. ල.4
2. තනි පුද්ගල ව්‍යාපාරයක වාසි හා අවාසි 3 බැගින් ලියන්න. ල.6

05)

1. කුඩා ව්‍යාපාර පවත්වාගෙන යාමට සංවිධානය විය හැකි ආකාර 3 නම් කරන්න. ල.3
2. හවුල් ව්‍යාපාර සංවිධාන ක්‍රමයේ වාසි හා අවාසි 2 බැගින් ලියන්න. ල.4
3. වෙළඳපොලක සිදුවිය හැකි විෂමාචාර 3ක් ලියන්න. ල.3

06) පහත ප්‍රකාශ නිවැරදි නම් ( √ ) ලකුණද වැරදි නම් ( X ) ලකුණද යොදන්න.

1. ජල නළ මාර්ගයකට කරාමයක් සවිකිරීම සඳහා කරාම කෙවෙනිය භාවිතා වේ ( )
2. විධිමත් භූමි අලංකරණය ලෙස හැඳින්වෙන්නේ ස්වභාවික අයුරින් ශාක වැඩීමට ඉඩදීමයි ( )
3. බෝගවලට කොම්පෝස්ට් යෙදීම නිසා පසේ තෙතමනය රඳවා තබා ගැනීමට හැකිවේ ( )
4. Reduce, reuse, recycle යනු අපද්‍රව්‍ය කළමණාකරණයේ 3R සංකල්පයයි ( )
5. වර්ණවත් පත්‍ර සහිත බතල වගා භූමි අලංකරණයේදී ආවරණ ශාක ලෙස යොදාගැනේ ( )
6. බ්‍රැසිනා විසිතුරු පත්‍රිකා ශාකයක් ලෙස හඳුනාගත හැකිය . ( )
7. භූමි අලංකරණයේදී යොදාගන්නා භූමියේ භූගෝලීය පිහිටීම ගැන සැලකිලිමත් විය යුතුවේ ( )
8. ප්‍රාග්ධන කොටස් විකිණීම තුළින් ප්‍රාග්ධන රැස්කර ගැනීම කුඩා පෞද්ගලික සමාගම් ව්‍යාපාර ක්‍රමයේ වාසියකි ( )
9. තනි පුද්ගල ව්‍යාපාරයකදී අලාභදායක තත්ත්ව වලට අයිතිකරු විසින් තනිවම මුහුණ දිය යුතුය ( )
10. එකම ආහාර අමුද්‍රව්‍යයක් විවිධ ස්වභාවයට පත්කර ආහාර සෑදීමේදී ඒවායේ රසය හා වයනය වෙනස්වේ ( )